---

**හපුතලේ නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 02 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 14 දින ද විගණනයට ඉදිරිපත් කර තිබු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 ජුලි 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති හපුතලේ නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂය තුල ඉදිකිරීම් නිමකරන ලද සහා බහුකාර්ය ගොඩනැගිලලේ වටිනාකම රු.56,022,898 ක් ද, හපුතලේ නගරයේ නවීන පන්නයේ වැසිකිලියේ වටිනාකම රු.1,001,418 ක් ද, වටිනාකම ගණනය නොකළ දේපල 21 ක වටිනාකමද මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැර තිබුණි.

(ආ) බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දේශය ණය සහ සංවර්ධන අරමුදලෙන් ලබාගෙන තිබූ ණය මුදල සඳහා ණය ගෙවීමේ සහන කාලයට අදාලව ගෙවිය යුතු රු.1,706,842 ක පොලිය සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තයේ අවසන් කොටස් ගෙවීමේ සභාවේ දායක මුදල රු.598,301 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.221,250 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම ව ආදායම රු.5,154,215 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 5,654,729 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 1,830 | 1,776 | 2,180 |
| (ii) | බදු කුලී | 6,808 | 7,283 | 8,670 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 315 | 385 | 92 |
| (iv) | වෙනත් ආදායම් | 62,795 | 31,606 | 2,721 |

#### 2.2.2 බදු කුලී

(අ) ඉකුත් වර්ෂවලදී මස් හා මාළු කඩ බදු ගත් බදුකරුවන් ගෙන් අයවිය යුතුව පවතින රු.292,167 ක් සහ සමාලෝචිත වර්ෂයේ දී බදුගත් බදුකරුවන්ගෙන අයවිය යුතුව පවතින රු.355,291 ක බදු කුලී 2013 පෙබරවාරි වන විටද අයකරගෙන නොතිබුණි.

(ආ) ආතර් සිරිසේන මාවතේ පිහිටි සභාව සතු කඩ කාමර සඳහා මාස 46 සිට මාස 176 දක්වා කාල පරාසයක් ද අනෙකුත් කඩ කාමර සඳහා මාස 10 සිට මාස 68 දක්වා වූ කාල පරාසයක් ද බදු කුලී හිඟව පැවති අතර ගිවිසුම් ප්‍රකාරව හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මසකට රු.150 ක් බැගින් වූ බදු මුදලකට නිවාස තනාගැනීම සඳහා සභාව සතු බිම් කැබලි 47 ක් බදුගත් බදුකරුවන්ගෙන් අඛණ්ඩව බදු කුලී ගෙවීම පැහැර හැර තිබුන 21 දෙනෙකුගෙන් හිඟ බදු කුලී අයකර ගැනීමට පිධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු ගවමස් කඩය 2011 වර්ෂයේ දී රු.2,251,200 කට ලංසු කැඳවා බදු දී තිබූ අතර, 2012 වර්ෂයට බදු දීම සඳහා ලංසු කැඳවීමේ දී අවම ලංසුව ලෙස ඉකුත් වර්ෂයේ ලංසු මුදල වෙනුවට ඉකුත් වර්ෂයේ අවම ලංසුවට සියයට 5 ක් එකතු කර තක්සේරු කර රු.1,765,830 කට බදුදී තිබුණි. එම නිසා සභා අරමුදලට අවම වශයෙන් රු.485,370 ක අලාභයක් සිදුව තිබුණි.

(ඉ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන තක්සේරුකරු හෝ පළාත් පාලන ආයතන සම්බන්ධ තක්සේරුකරුවකු මඟින් සභාව සතු කඩ කාමර 263 ක් සඳහා මාසික කුලී තක්සේරු කරවාගෙන නොතිබුණි.

(ඊ) දිනපතා වෙළඳපල පිහිටි කඩ කාමර 79 ක් සඳහා 2009 ජුනි සිට ගාස්තු බිල්කිරීම් සභා තීරණයක් මත අත්හිටුවා තිබූ අතර, එම කඩ කාමරවලින් අයවිය යුතු පැරණි හිඟ බදු කුලී රු.603,900 ක් ද අයකරගෙන නොතිබුණි.

### 2.2.3 දැන්වීම් පුවරු ගාස්තු

නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 157 (6) (උ) වගන්තිය ප්‍රකාරව ප්‍රචාරක දැන්වීම් පුවරු සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශය තුල ස්ථාපිත කර තිබූ එවැනි ප්‍රචාරක දැන්වීම් පුවරු 08 ක් පැවතුනි

### 2.2.4 වෙනත් ආදායම්

නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 164 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2005 අංක 38 දරන සංචාරක පනතේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති සභා බල ප්‍රදේශය තුල පිහිටි හෝටල් / ලැගුම්හල් 02 කින් අදාල වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම්වලින් සියයට 1 නොඉක්මවන ගාස්තුවක් අතුරු ව්‍යවස්ථා පනවා සභාවට අයකර ගෙන නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.73,545 ක හිඟ බලපත්‍ර ගාස්තුවලින් සමාලෝචිත වර්ෂය තුල අයකිරීම රු.6,300 ක් වූ අතර, එය සියයට 9.2 ක් තරම් පහල අගයක පැවතිනි.

### 2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

රු.

| | | |
|---|---|---|
| (i) | උසාවි දඩ | 50,000 |
| (ii) | මුද්දර ගාස්තු | 644,170 |

## 2.3 නිශක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

සභාව සතු සාමාන්‍ය තක්සේරුව රු.300,000 ක් පමණ වූ රුමේනියන් වර්ගයේ මාර්ග තලනයක් 2007 වර්ෂයේ සිටම නිශ්ක්‍රියව සභා භූමියේ රඳවා තිබුණි.

## 2.4 අවිධිමත් ගනුදෙනු

2012 දෙසැම්බර් මාසය තුල අවස්ථා 04 කදී රු.240,862 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය මිලදී ගෙන තිබූ අතර, ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 763 හි විධිවිධාන පරිදි තොග පොත්වල වාර්තා කර නොතිබූණි. එක් එක් කර්මාන්තය සඳහා නිකුත් කළ ප්‍රමාණය, ඉතිරි ප්‍රමාණය හඳුනාගත හැකි ආකාරයට තොග ලේඛණ පවත්වා නොතිබුණි. ගබඩාවට ද්‍රව්‍ය භාරගැනීමේ කුවිතාන්සි පොත් අනුක්‍රමික අංක පිළිවෙලට භාවිතා කර නොතිබුණු අතර, එකවර කුවිතාන්සි පොත් කීපයක් භාවිතා කර තිබූ බැව් විගණනයේදී අනාවරණය විය.

## 2.5 කොන්ත්‍රාත් පර්පාලනය

### බහුකාර්ය ගොඩනැගිල්ල ඉදිකිරීම

නිමි වැඩ වටිනාකම රු.56,022,898 ක් වූ මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර කොන්ත්‍රාත්කරු විසින් සභාව වෙත භාරදී තිබූ අතර, 2013 පෙබරවාරි 13 දින සිදුකළ භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගොඩනැගිල්ලේ පසුපස සිට ඉදිරිපසට තද සුළං ප්‍රවාහයක් පවතින අතර ඉදිකිරීම් සැලසුම් කිරීමේ දී ඒ පිළිබඳව නොසලකා ලූවස් ආකාරයෙන් ජනෙල් දොරවල් යොදා තිබුණි. එම නිසා වැසි දිනවලදී වැසි ජලය ගොඩනැගිල්ල තුලට ගලාවිත් තිබූ අතර, සෑම මහලකන්ම ජලය ගොඩනැගිල්ලතුලට කාන්දු වී තිබුණි.

(ii) තුන්වන මහලේ වහලය සඳහා ජිප්සම් බෝඩ් සිවිලිමක් සවිකර තිබූ අතර, එයින් සියයට 80 - සියයට 90 ක් පමණ ප්‍රමාණයක් ගැලවී තිබුණි. එම මහලේ බිත්තිය හා සිවිලිම අතර අඟල් 1/2 ක පමණ පරතරයක් පැවති අතර, ගොඩනැගිල්ලේ පිටුපස කොටසේ සිවිලිමේ තහඩු අතර පරතරය ආවරණය කිරීමට යොදා තිබූ ප්ලාස්ටර් පැරිස් ගැලවී තිබුණි.

(iii) ගොඩනැගිල්ලේ ඉහල මහලේ ඉදිරිපස හා පිටුපස කොටසට යොදා තිබූ ආරක්ෂිත යකඩ වැටවල් මල බැඳී තිබුණි.

(iv) දෙවන මහලේ කොන්ක්‍රිට් ස්ලැබ් එක තුලින් ජලය කාන්දුවීම නිසා දුර්වර්ණ වී තිබූ අතර, නාන කාමරවල වතුර බැස්ම ක්‍රමවත් වන පරිදි බිම සකසා නොතිබුණි.

## 2.6 මෙහෙයුම් / කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ, සේවය හැර ගිය හා මියගිය සේවකයින් 29 දෙනෙකුගෙන් අයවිය යුතු රු.175,065 ක් වන සේවක ණය ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 1:6 හා 4 වගන්තිවල විධිවිධාන පරිදි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1998 සිට 2003 දක්වා කාලය තුල සභාවට ආදායම් ලෙස ලැබී අගරු වූ චෙක්පත් 05 ක වටිනාකම රු.33,976 ක් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189 (උ) ප්‍රකාරව මුදලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සභාව විසින් 1997 සිට 2012 දක්වා කාලය තුල විවිධ පාර්ශවයන් වෙත දෙන ලද අත්තිකාරම් රු. 318,337 ක් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව පියවාගෙන නොතිබුණි.

(ඈ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන සංශෝධිත පනත් මගින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව අනුව සභාව සතු ගෝඝාතකාගාරය සඳහා පරිසර බලපත්‍රයක් සහ 2012 වර්ෂය සඳහා පරිසර බලපත්‍රයද ලබාගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය